හෝ සිංහලෙන් කතා කිරීම අවශ්‍ය යැයි ඔවුන්ට කිසිසේත් ම නොසිතේ.

2. තමන් ලංකාවේ දී කුඩා කල ඉංග්ලිෂ් භාෂාව එතරම් දැන නොසිටි සහ භාවිතා නොකළ නමුත් තම දරුවන් සමග ඕස්ට්‍රේලියාවේ දී ඉංග්ලිෂ් භාෂාවෙන් පමණක් කතා කරන අය

මේ අයගෙන් බහුතරයක් දෙනා සිතන්නේ තමන් ගේ වෘත්තීය දියුණුව ඉංග්ලිෂ් භාෂා දැනුමේ අඩුපාඩු නිසා තරමක් අඩාල වූ බවත් එනිසා තම දරුවන්ට ඉංග්ලිෂ් පමණක් ඉගැන්විය යුතු බවත් ය. එනිසා ඔව්හු තම දරුවන් සමග සිංහල භාෂාවෙන් කතා නොකරති. කාලය දීපය දේශය වෙනස් බව ඔවුන්ට නොතේරෙන සේ ය.

3. ලංකාවේ දී ඉංග්ලිෂ් භාෂාව වැඩි දැනුමක් නොතිබුණු හෝ කිසිදු භාවිතයක් හෝ නොතිබුණු සහ ඕස්ට්‍රේලියාවේ දී තම දරුවන් සමග ඉංග්ලිෂ් භාෂාවෙන් කතා කරන අය

මේ පිරිස එසේ කරන්නේ තමන්ගේ වැඩි දියුණුව පිණිස තම දරුවන් ගෙන් ඉංග්ලිෂ් භාෂාව ඉගෙනීමට බව මගේ අදහසයි.

ඇත්තටම මෙහේ ජීවත් වෙන අපේ ළමයින්ට සිංහල ඉගෙනගෙන මොන ප්‍රයෝජනයක් දැයි සිතන දෙමව්පියන් ඉහත තෙවර්ගයේ ම සිටිති. ඒ සමහරු ලිං මැඩියයන් ය. ඕස්ට්‍රේලියාවේ රජයේ පාසල් හි පවා ඉතාලි, ප්‍රංශ, ස්පාඤ්ඤ, ඉන්දුනීසියානු, ජපන්, චීන යනාදී එක් භාෂාවක් හෝ උගන්වන්නේ ඇයි දැයි ඔවුන්ට නොතේරේ.

මේ බොහෝ භාෂා උසස් පෙළ විභාගය සඳහා ද හැදෑරිය හැක. සිංහල භාෂාව ද මෙල්බර්න් නුවර පිහිටි වික්ටෝරියා ප්‍රාන්තයේ උසස් පෙළ විෂයයකි.
සංක්‍රමණික සිංහල දෙමව්පිය සර්වත්‍ර කුලකය සම්පූර්ණ කිරීමට මා පෙර දැක්වූ දෙමව්පිය කණ්ඩායම් තුනට සිව්වෙනි කොටසක් ද එකතු කළ යුතුය.

ඒ තම දරුවන් සමග සිංහල භාෂාවෙන් කතා කරන, ඔවුන්ව මෙරට පවත්වාගෙන යන සිංහල භාෂා පාසල් කරා සතිපතා රැගෙන යන පිරිස ය. මගේ බිරිඳ සහ මා ද දස වසරක් ම එසේ කළෙමු.
දෙමව්පියන් ගේ උනන්දුව මත පිහිටුවා පවත්වාගෙන යන මේ සිංහල භාෂා පාසල් සදහා රජයෙන් මූල්‍යාධාර, ගොඩනැගිලි පහසුකම්, ගුරු පුහුණුව සහ වෙනත් ආධාර ද ලැබේ.

සිනුවර තුළ මේ සිංහල භාෂා පාසල් අරඹා දැන් වසර විසි හතක් පමණ ගත වී ඇත. ඒ පාසල් සමූහය ක්‍රියාත්මක වෙන්නේ නිව් සවුත් වේල්සයේ සංස්ථාපිත ආයතනයක් වන සිංහල සංස්කෘතික හමුවේ අනුග්‍රහයෙනි.

සිනුවර තදාසන්නයේ පැරමටා, බ්ලැක්ටවුන්, මින්ටෝ නගරවල පමණක් නොව, නිව් සවුත් වේල්ස ප්‍රාන්තයේ දුර බැහැර පිහිටි නිව්කාසල්, ඩබෝ සහ වග වගා යන නගරවල ද දැන් සිංහල භාෂා පන්ති පැවැත්වේ.

**රසිකොලොජිස්ට්**
(rasikalogy.blogspot.com)




